# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2290/25 – 2022 ජුලි 28 වැනි බ්‍රහස්පතින්දා – 2022.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/222.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ඒ. ඒ. යූ. කුමාර මයා, හවුපේ වෙලගොඩවත්ත, අඹකොටුව, අඟුළුගහ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 9, කෝවිල් වීදිය, කොළඹ - 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කුරුණෑගල, මීගමු පාර, ගජබා මාවත, අංක 11, ඩබ්. ඒ. බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

1A – G 37133 – 14 (2022/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2019/222.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ඒ. ඒ. යූ. කුමාර මයා, හවුපේ වෙලගොඩවත්ත, අඹකොටුව, අඟුළුගහ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීටින් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 9, කෝවිල් වීදිය, කොළඹ - 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීටින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවක කේ. ඒ. ඒ. යූ. කුමාර මහතාට ඉදිරිපත් කළ චෝදනා හා ලබා දී ඇති දඬුවම් මඟින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ සිදු වී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්න වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජුනි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0149

---

මගේ අංකය: IR/COM/04/2019/336.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න, අංක 111/6 බී, පරණ පාර, නාවින්න, මහරගම.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, අඹන්පොල, බවනපුර, අංක 04, නීතිඥ ඩී. එම්. එම්. බී. බක්මීවැව මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2019/336.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න, අංක 111/6 බී, පරණ පාර, නාවින්න, මහරගම.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

විජය කුමාරතංග අනුස්මරණ රෝහල, සීදූව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න මහතා සීදූව, විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ ලෙස පත් කළ 2018.06.05 සිට 2018.09.01 දක්වා වන කාලය සඳහා සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශ ලේකම්ගේ MH/MS/WKMH/05/24/2017 අංක හා 2018.04.05 දිනැති ලිපියට අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2018 ප්‍රකාරව දීමනා හිමි ද? හිමි නම් එය නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.
EOG 07 – 0150